සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

7 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 11 S

# බුද්ධ ධර්මය - I කොටස

නම ................................................ කාලය පැය දෙකයි

උපදෙස් :
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40 ක් හිමි වේ.

✶ අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) බුදුරජාණන් වහන්සේ සත් සතිය ගත කළ ආකාරය දැක්වෙන ගාථා පාඨය මින් කුමක් ද?
i. "ඕවාද සිප්ප දානේන" යන ගාථා පාඨය යි.
ii. "පඨමං බෝධි පල්ලංකං" යන ගාථා පාඨය යි.
iii. "අංගාරි නෝදානි දුමා භදන්තේ" යන ගාථා පාඨය යි.
iv. "න පරෝ පරංනිකුබ්බේථ" යන ගාථා පාඨය යි.

(2) අප මහා බෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වූ පුර පසළොස්වක පොහෝ දිනය වන්නේ
i. බිනර පුර පසළොස්වක පොහෝ දිනය යි.
ii. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය යි.
iii. වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය යි.
iv. ඇසළ පුර පසළොස්වක පොහෝ දිනය යි.

(3) බුදුරජාණන් වහන්සේ කළගුණ සැලකීමේ ගුණය ලොවට ආදර්ශයෙන් පෙන්වා දුන්නේ සත් සතියෙන් කීවෙනි සතියේදී ද?,
i. පළමුවැනි සතියේ දී.
ii. දෙවැනි සතියේ දී.
iii. තුන්වැනි සතියේ දී.
iv. හතරවැනි සතියේ දී.

(4) බුදුරජාණන් වහන්සේ රෝගීන්ට උපස්ථාන කිරීමේ වටිනාකම ආදර්ශයෙන් ම ලොවට පෙන්නුම් කළ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකි. එම ගුණය හඳුන්වන්නේ,
i. මහා කරුණා ගුණය නමිනි.
ii. අසරණ සරණ ගුණය නමිනි.
iii. යථාවාදී තථාකාරී ගුණය නමිනි.
iv. ගිලානෝපස්ථානය නමිනි.

(5) උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
i. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීමයි.
ii. රෝගියා කෙරෙහි නොරුස්නා ගතියක් පෙන්වීමයි.
iii. මළ මූත්‍රා ආදිය කෙරෙහි පිළිකුල් නූපද වීමයි.
iv. රෝගියාගේ සිත සැනසෙන කථා පැවසීමයි.

(2 x 5 = 10)

★ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

(6) පටාචාරා අනපේක්ෂිත අයුරින් විපත් රැසකට මුහුණ දුන් කාන්තාවකි. ( )

(7) බුදුරජාණන් වහන්සේ පූතිගත්ත තිස්ස තෙරුන්ට ඇප උපස්ථාන කිරීමට උදව් ලබා ගත්තේ සැරියුත් තෙරණුවන්ගෙන් ය. ( )

(8) බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම ආරම්භ කරන ලද්දේ මැදින් පුර පසළොස්වක පොහොය දිනයක ය. ( )

(9) වසරක් ගතවන විට බුද්ධ ශාසනයේ රහතන් වහන්සේලා ගණන දස දහසක් විය. ( )



LIVEWORKSHEETS

(10) නව අරහාදී බුදුගුණ අපගේ බිය සැක දුරුකර ගැනීමට මහත් රුකුලක් වේ. ( )

( 2 x 5 = 10)

★ **ප්‍රශ්න අංක 11 සිට ප්‍රශ්න අංක 15 දක්වා දී ඇති ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

(11) ................................................ පාඨය මගින් බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ බුදුගුණ විස්තර කර තිබේ.
(ඉතිපිසෝ භගවා අරහං, ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ, සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ)

(12) කෝසල රාජ්‍යයේ අගනගරය වූ ................................................ සුමන නම් සිටුවරයෙක් වාසය කළේය.
(සැවැත් නුවර, කිඹුල්වත් නුවර, කොසඹෑ නුවර)

(13) බුදුරජාණන් වහන්සේ දිවි ගෙවූ පන්සාලිස් වසක කාලයෙන් ................................................ වසක් වාසය කර ඇත්තේ සැවැත්නුවර ජේතවනාරාමයේය.
( විසිඑක්, දහ අට, දහනව)

(14) ................................................ දියණිය වැස්සේ තෙමී තෙමී සුපුරුදු සන්සුන් ගමනින් අසල තිබූ ශාලාවකට පැමිණියාය.
( විශාඛා, උත්පලවණ්ණා, ඛේමා )

(15) වැසි නොවැටෙන වියළි සමය ................................................ ඍතුව නමින් හඳුන්වනු ලබයි.
( වසන්ත, ගිම්හාන, හේමන්ත)

(2 x 10 = 10)

★ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වල "අ" තීරුවට ගැළපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා එහි අංකය වරහන් තුළ ලියන්න.**

| | "අ" තීරුව | | "ආ" තීරුව |
|---|---|---|---|
| (16) | බුදු සසුනේ අග්‍ර දායිකාව | ( ) | 1. සත්ථා දේව මනුස්සානං |
| (17) | සෝවාන් වූ පළමු රජතුමා | ( ) | 2. සුමනා |
| (18) | නව අරහාදී බුදුගුණ | ( ) | 3. කාව්‍ය ශේඛරය |
| (19) | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි | ( ) | 4. විශාඛා සිටු දියණිය |
| (20) | අනේපිඬු සිටුතුමාගේ දියණිය | ( ) | 5. බිම්බිසාර රජතුමා |

(2 x 10 = 10)



LIVEWORKSHEETS